ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**දිනය** 27.05.2014

## ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම

ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනයේ ලාභදායි තත්ත්වය ඉහළ නැංවීමට සහ ආයතනය තවදුරටත් ස්ථාවර කිරීම සඳහා එම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට **2014** මැයි **26** දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් **2011** අංක **42** දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන අනුව නව අධ්‍යක්ෂවරුන් කිහිප දෙනෙක් පත් කිරීම මගින් ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර ඉදිරි ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නියෝගයන්ද නිකුත් කරන ලදී.

ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපාර සැලැස්මට අනුගත වීම සඳහා ආයතනයේ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාර යෝජනා ක්‍රමය යටතේ දීර්ඝකාලීන ණය පහසුකමක් ලබා දීමටද මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අංශය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධතා සැලැස්ම අනුව සුදුසු නව ආයෝජකයෙකු ආකර්ශණය කර ගැනීමට සමාගමට හැකිවනු ඇතැයි මුදල් මණ්ඩලය අපේක්ෂා කරයි.

ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය අතරින් එම්.පී. ජයවර්ධන මහතා (සභාපති / විධායක නොවන අධ්‍යක්ෂ) සහ සී. රෝසා මහත්මිය (විධායක නොවන අධ්‍යක්ෂ) විසින් ප්‍රතිව්‍යුහගත කරන ලද නව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට අදහස් නොකරන බව දන්වන ලදී. ඒ අනුව, ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනයේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ.

ආචාර්ය එස්.එච්.ඒ.එම්. අබේරත්න (සභාපති)
එස්. රාජපක්ෂ මහතා, **FCA** (උප සභාපති)
ඒ.පී. ලේකම්ගේ මහතා, **M.Sc** (කළමනාකාර අධ්‍යක්ෂ)
ටී.බී. ඒකනායක මහතා, නීතිඥ (විධායක අධ්‍යක්ෂ)
ආර්. අතුකෝරල මහතා, **MBA** (විධායක නොවන අධ්‍යක්ෂ)
ආර්.ඩී. අබේවික්‍රම මහතා, **ACA** (විධායක අධ්‍යක්ෂ)
ආචාර්ය ටී. සෙන්තිල්වේල් (විධායක නොවන අධ්‍යක්ෂ)